# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## මුස්ලිම් විවාහ හා දික්කසාද
## (සංශෝධන)

**(115 වන අධිකාරය වූ) මුස්ලිම් විවාහ හා දික්කසාද පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

අග්‍රාමාත්‍ය සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින්
2013 මාර්තු මස 08 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 පෙබරවාරි මස 26 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[225 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 6.00 යි** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## නීතිය බලපෑමේ ප්‍රකාශය

(මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය") යනුවෙන් සඳහන් කරනු ලබන (115 වන අධිකාරය වූ) මුස්ලිම් විවාහ හා දික්කසාද පනතේ 18 වන සහ 94 වන වගන්තිවලට මේ පනතේ 2 වන හා 3 වන වගන්ති මගින් කරන ලද සංශෝධන මගින්, ගෙවිය යුතු ගාස්තු මුදලින් ගෙවිය යුතු බවට නිශ්චිතව දක්වා ඇත.

## මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන)

එල්.ඩී.—ඕ. 16/2013.

## (115 වන අධිකාරය වූ) මුස්ලිම් විවාහ හා දික්කසාද පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.*

**1.** මේ පනත 2013 අංක ..... දරන මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2013 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

*(115 වන අධිකාරය වූ) මුස්ලිම් විවාහ හා දික්කසාද පනතේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (115 වන අධිකාරය වූ ) මුස්ලිම් විවාහ හා දික්කසාද පනතේ 18 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(3) නියමිත ගාස්තුව මනාලයා විසින් ගෙවනු ලැබිය යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඌ) ඡේදයේ "ප්‍රකාශයක් සඳහා ගෙවිය මුද්දර ගාස්තුව ;" යන වචන වෙනුවට "ප්‍රකාශයක් සඳහා ගෙවිය යුතු ගාස්තුව" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*වලංගුභාවය සහ හානිපූරණය.*

**4.** 2013 ජනවාරි මස 1 වන දින සිට ආරම්භව 2013 මාර්තු මස 31 වන දිනයෙන් අවසන්වන කාලය දක්වා අයකිරීම සඳහා හෝ එකතු කිරීම සඳහා මේ පනත මගින් බලය දී ඇති යම් කාර්යයක් සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ ඔහු වෙනුවෙන් නැතහොත් මේ පනත යටතේ බලය පවරන යම් තැනැත්තකු විසින් අයකරනු ලබන හෝ එකතු කරනු ලබන යම් ගාස්තු රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ මේ පනත යටතේ බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකු විසින් වලංගු ලෙස අය කරනු ලැබ හෝ එකතු කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද, මේ වගන්තියේ ඉහත කී විධිවිධාන, ඉහත කී කාලසීමාව තුළ දී අයකරනු ලබන හෝ එකතු කරනු ලබන ගාස්තු සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් කරනු ලබන තීරණයකට හෝ නියෝගයකට නැතිනම් යම් අධිකරණයක විභාග වෙමින් පවත්නා නඩු කටයුතු සඳහා බල නොපෑ යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.